# *ඔසු වවමු - ඉසුරු ලබමු*

## හාතාවාරිය




- උද්භිද නාමය :- *Asperagus racemosus*
- ශාක කුලය :- Asperagaceae
- පොදු සිංහල නම :- හාතාවාරිය
- සංස්කෘත නම :- ශතාවරී
- දෙමළ නම :- තනීර් විට්ටන් කිලංගු
- ඉංග්‍රීසි නම :- Indian Asparagus
- රෝපණ ද්‍රව්‍ය :- බීජ / උදුරාගත් කුඩා වැල්
- ඖෂධ සඳහා ගැනෙන ව්‍යවහාර අංග :- අල

## හැඳින්වීම

ලංකාවේ වියලි කලාපය තෙත් කලාපය ප්‍රදේශවල දැකිය හැකි වැලක් වන හාතාවාරිය ගෙවතුවල , බඩ වැටි වල ,වනගතව දැකිය හැකි ශාකයකි . කොළ කැඳ සෑදීම සඳහා ජනතාව අතර ජන්ප්‍රිය ශාකයකි . පත්‍ර හා අල මේ සදහා යොදා ගනී.

## උද්භිද විද්‍යාත්මක විස්තරය

හාතා වාරිය ශාකය අප්‍රිකාව දකුණු ආසියාව නිජබිම කරගත් ශාකයකි . අතු බෙදුණු කොළ පැහැති කඳක් සහිත පඳුරු ආකාර වැලකි. මීටර් 2-4 දිගට වැවෙන වැලෙහි වැලෙහි සහ අතුවල කටු පිහිටා ඇත . භූගත කඳක් සහිත වන අතර එයින් හටගන්නා ආබන්ධිය මුල් ආහාර තැන්පත් වී මහත් වී අල පොකුරක් ආකාරයට දැකිය හැක. ශාකයේ කොළ හට නොගනියි .කොළ ලෙස සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ අතු විකරණය වී සෑදෙන ව්‍යුහයන්ය. ඒවා ස්කන්ධාභ ලෙස හඳුන්වයි.පත්‍ර  ක්ෂීන වී ශල්ක පත්‍ර බවට පත්වී ඇත . සුදු පැහැති මල් පොකුරු හටගන්නා අතර  එයින් ඇතිවන ඵලයන් තුළ බීජ 1-3 අතර සංඛ්‍යාවක් පවතී.

## කෘෂි විද්‍යාත්මක විස්තරය

ඖෂධ නිෂ්පාදනය සඳහා අමු හෝ වියළි අල භාවිතා කරන අතර වානිජමය වශයෙන් වගා කිරීමක් දක්නට නොලැබෙයි . බීජ තවාන් දමා රෝපණය කිරීමෙන් නව ශාක බිහිකර ගත හැකිය . නැතිනම් කුඩා ශාක ගලවා පැලකිරීමද සිදු කල හැක. බීජ තවාන් දමා සෑදෙන කුඩා පැල සති 3ක් පමන වන විට අධාරක ශාකයක් හෝ ඉපල් අසල සිටුවීම සිදු කල හැක. අඩි 3×3×3 වලක් කපා එයට මතුපිට පස් හා කොම්පෝස්ට් පොහොර 1:1 අනුපාතයට මිශ්‍ර කර ඒ තුල කුඩා ශාක සිටුවීම සිදු කරයි. ශාක අතර මීටර එකක පමණ පරතරයක් තිබීම වැදගත් වන අතර් පසේ තෙතමනය අඩු කිරීමට උස් පාත්ති සැකසිය යුතුයි . සිටුවා අවුරුදු 1-2 අතර කාලයේදී අස්වැන්න ලබා ගත හැකි අතර ශාකය ඉවත් නොකර අල හාරා ගලවා ගැනීමෙන් වාර කිහිපයක් හොඳින් නඩත්තු කර අස්වැන්න ලබා ගත හැක.

## අස්වනු නෙළීම හා ගබඩා කිරීම

අස්වැන්න වශයෙන් ලබා ගන්නේ භූගත කඳෙන් හටගන්නා මුල් මහත් වීමෙන් සෑදෙන අලයන්ය. ඒවා හොඳින් පිරිසිදු කර සම්පූර්ණ අලය හෝ පෙති කපා වියලිමෙන් කල් තබා ගැනීම හෝ වෙළඳපොලට නිකුත් කිරීම සිදු කරයි. ඇතැම් විට අලයෙන් ලබා ගන්නා පිටි වශයෙන් ද වෙළඳපොල තුල දැකිය හැක.

## වර්තමාන භාවිතය හා වෙළඳපොළ තත්ත්වය

ලංකාව තුළ වාණිජ වගාවක් වශයෙන් එතරම් ප්‍රචලිත වී නොමැත. ඖෂධ නිෂ්පාදනයට වනගතව / ගෙවතුවල ඇති ශාක භාවිතා කරත් නැවත වගා නොකරන නිසා ක්‍රමයෙන් පරිසරයෙන් තුරන් වී යන ප්‍රවනතාවක් ඇත. එබැවින් වගා කිරීම සදහා පෙළඹවීම සිදුකල යුතුය . වර්තමානයේ වෙළඳපොල තුල වියලි හාතාවාරිය අල කිලෝවක් සදහා  රු. 500/= - 750/= අතර මිලක් පවතී.